# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2265/42 - 2022 පෙබරවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/6/2019/එච්ඩබ්/195.
මගේ අංකය : ඩීඑස්ජීඑන්/එල්එන්ඩී/08/එල්ඒ/එච්ඩබ්/15.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඳිගැටවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලම්පෝරුව ගමේ පිහිටි, හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 255, අතිරේක අංක 28, පත්‍ර අංක 35 හා 2021.04.30 දිනැති පිඹුරේ කැබලි අංක 1739 සිට 1741 (කැබලි 03) දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0438 ක් වූ ඉඩම් කොටස්:

01. **කැබලි අංක 1739**
ඉඩමේ නම: මයිලදෙනියමූකලාන හෙවත් ඉහලදිගනෙඅත්මගහේන; ඉඩමේ විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: හේවා මයිනාත්තුගේ නිහාල්, හකුරුවෙල, තලම්පෝරුව; ප්‍රමාණය: හෙක්. 0.0073.

02. **කැබලි අංක 1740**
ඉඩමේ නම: කොන්ගහකොරටුවහේන; ඉඩමේ විස්තරය: මාර්ගය සහ විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විජේසේකර පතිරණගේ අමරසේන, හකුරුවෙල, තලම්පෝරුව; ප්‍රමාණය: හෙක්. 0.0351.

03. **කැබලි අංක 1741**
ඉඩමේ නම: ඉහලදිගනෙඅත්මග; ඉඩමේ විස්තරය: මාර්ගය සහ විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0014.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.02.21 වන දින පෙ.ව.10.00ට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2022.02.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් හා
අත්කර ගැනීමේ නිලධාරි,
අඟුණකොළපැලැස්ස

2022.01.28
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

EOG 02 - 0377